**බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම**

**2012 නොවැම්බර් මස 20 වන දින පෙ.ව 9.30ට**

# නාාය පත්‍රය

I. **සභාපතිවරයාගේ නිවේදන**

II. **ලිපි ලේඛන පිළිගැන්වීම**

III. **කාරක සභා වාර්තා පිළිගැන්විම**

IV. **පෙත්සම්**

V. **ප්‍රශ්න**

01. **ගරු උදේන විජේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2012.11.06 දින අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/V (1)12/24)**

අ. මීරිගම බණ්ඩරනායක මහා විදුහල, මීරිගම ආදර්ශ කණිෂ්ඨ විදුහල,පස්යාල ප්‍රාථමික විදුහල, පල්ලේවල මහ විදුහල යන විදුහල්වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේදී විවධ අක්‍රමිකතා සිදුවන බව ඔබතුමා දන්නේද?

ආ. පවතින ක්‍රමය අනුව ඇතුළත් කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් වැඩිම ලකුණු ලබා ගන්නා ළමුන් 33 දෙනෙක්, අභියාචනාවලින් ළමුන් දෙදෙනෙක් හා ක්‍රියාන්විත රාජකාරියේ යෙදෙන අයවලුන්ගේ ළමුන් 07 දෙනෙක් වශයෙන් ළමුන් 42ක් ඇතුළත් කරගන්නා බව ඔබතුමා දන්නේද?

ඇ. පන්තියක ළමුන් 45 දක්වා ඇතුළත් කිරීමේදී ඉතිරි තිදෙනා සහ මූලිකව තෝරාගත් ළමුන්ගේ අඩුවක් වුවහොත් එම සංඛ්‍යාව ඇතුළත් කරනුයේ සම්මුඛ පරීක්ෂණයේ වැඩි ලකුණු ලබා ගත් පදනම යටතේද? නොඑසේ නම් වෙනත් ක්‍රමවේදයක් හරහාද?

ඈ. වැඩි ලකුණු ලබා ගත් පදනමින් බැහැරව කටයුතු කරන්නේ නම් එයින් ළමුන්ට අසාධාරණයක් වන බව ඔබ තුමා පිළිගන්නේද ?

ඉ. මෙවැනි අසාධාරණයක් වැළැක්වීමට ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

ඊ. ඉහත කී විදුහල්වල 2013 වසරට ඇතුළත් කර ගැනීමට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වූ ළමුන්ගේ නාම ලේඛණයක් ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමාණයන් හා ඇතුලත් කිරීමට පදනම් කරගත් ලකුණු ප්‍රමාණයන් සභාගත කරන්නේද?

**02. ගරු යූ.ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමූපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් 2012.11.06 දින අසන ලද ප්‍රශ්නය:**

**(ප්‍ර/V (1)12/25)**

අ. පළාත් සභා සමූපකාර අමාත්‍යාංශය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ පවතින සණස සමිති ප්‍රමාණය කොපමණද? එම සංගම් නම් වශයෙන් වෙන වෙනම සඳහන් කරන්නේද?

ආ. එම සංගම් වල තනතුරු සඳහා පත්කිරීමට බලය ඇත්තේ කාහටද ?

ඇ. සණස සමිති අතුරින් මහර ආසනයේ වැබඩ උතුර බටහිර සණස සංවර්ධන බැංකුවේ මූල්‍ය වත්කම් ප්‍රමාණය කොපමණදැයි සඳහන් කළ හැකිද? එකී වත්කම් පිළිබඳ විගණනයක් කර ඇත්තේද? ඒ කිනම් වර්ෂයේද ?

ඈ. එම මුදල් තැන්පත් කරුවන්ට තැන්පතු සඳහා නිසි සුරක්ෂිතභාවයක් තිබේද ?

ඉ. තැන්පත්කරුවන්ට මුදල් ආපසු ලබා ගැනීමට අයදුම්කල විට මුදල් ලබාගැනීමට දින ගණන් ගතවන බව ඔබතුමා දන්නෙහිද ?

ඊ. මේ පිළිබඳව කඩිනම් පරීක්ෂණයක් සිදුකර මෙම අපහසුතාවය මඟහැරවීමට පියවර ගන්නවාද? නොඑසේනම් මන්ද ?

උ. මෙයට පිළිතුරු සභාගත කරන්නේද ? නොඑසේනම් මන්ද ?

**03. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමූපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් 2012.11.06 දින අසන ලද ප්‍රශ්නය:**

**(ප්‍ර/V (1)12/26)**

අ. සී/ස පිළියන්දල බෝකුන්දර සමූපකාර සිමිතියේ මහා සභා කාලය 2010.05.21 වන දින අවසන් වූ අතර, පසුගිය වසර දෙක තුල ඡන්ද විමසීමක් පැවැත්වීමට කොමසාරිස්තුමා අසමත් වී ඇති බැවින් ඒ සම්බන්ධව ඔබතුමා ගන්නා පියවර කුමක්ද ?

ආ. ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ 35 “අ” අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කල යුත්තේ රාජ්‍ය නිලධාරීන් වන අතර, දැනට කොමසාරිස්තුමා විසින් පත් කර ඇති හිටපු සභාපති නන්දලාල් ජයසුන්දර මහතා හා ඒ.ඒ.ඩී සුනිල් යන අය දැරූ රාජ්‍ය තනතුරු මොනවාද ? කාල වකවානු කවරේද ?

ඇ. ඉහත නම් සඳහන් අධ්‍යක්ෂකවරුන් නගරයේ ව්‍යාපාරිකයින් වන අතර, මොවුන් පත් කිරීම නීති විරෝධී බව ඔබතුමා දන්නේද? එසේ නම් එම නිලධාරීන් සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක්ද?

ඈ. මෙම සමූපකාර සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලයට විරුද්ධව ඉදිරිපත්කර ඇති චෝදනා සම්බන්ධයෙන් ගරු ගාමිණී ලොකුගේ අමාත්‍යතුමා සහ ගරු පළාත් ප්‍රධාන අමාත්‍යතුමා මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන ලෙස දන්වා ඇති අතර, ඒ සම්බන්ධයෙන් ගත් පියවර කවරේද?

ඉ. ඔබතුමා විසින් නිපුණතා ඇති රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු පත් කළ පසු නැවතත් ඡන්ද විමසීමක් පවත්වන්නේ කවදාද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ රැස්වීම් I

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

*"2012.10.23 වින දින පැවති පළාත් සභා රැස්වීමේදී එළඹුණු සභා සම්මුතියට අනුව, 2012 දෙසැම්බර් මස 05,06,07 හා 10 යන දිනයන් "**2013 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු**" සඳහා වෙන් කළ දිනයන් වන අතර එම දිනවල වැඩ කටයුතු සඳහා රීති අංක 50 (5) හි සඳහන් කාලපරාසයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය"*

## සභාවේ රැස්වීම් II

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

" අද දින විසිර යාමෙන් අනතුරුව මෙම සභාව " **2012 දෙසැම්බර් මස 05 වන දින (බදාදා) පෙ.ව 9.00 ට** " රැස්විය යුතු අතර මින් පෙර කිනම් තීරණයකට එළඹියද ඒ කිසිත් නොතකා 2012 දෙසැම්බර් මස 04 වන දිනය (අඟහරුවාදා) සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතුය ."

## X. සභාවේ කටයුතු

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

" සභාවේ වැඩ කටයුතු සඳහා අද දිනය පොදු කටයුතු වෙනුවෙන් වෙන් කළ දිනයක් යැයි සලකා ක්‍රියා කළ යුතුය ."

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

## XII. පොදු කටයුතු

01. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

*" 2013 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය "*

(මුදල් ප්‍රකාශය සභාවට ඉදිරිපත් කිරීම)

02. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාවිසින් ඉදිරිපත් කරනු ලැබීමට

*" 2013 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය "*

(විසර්ජන ප්‍රඥප්තිය සභාවට ඉදිරිපත් කිරීම)

.

## XIII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2012.11.07
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.